සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

තෙවන වාර පරීක්ෂණය 2021

Third Term Test 2021

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I

පැය 2 යි
2 மணி
2 hour

## I කොටස

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. Electronic Numerical Integrator and Computer (ENIAC) පරිගණකයේ ප්‍රධාන නිපැයුම්කරුවෙකු වන්නේ,
   (1) බ්ලෙයිස් පැස්කල් (Blaise Pascal) ය
   (2) චාල්ස් බැබේජ් (Charles Babbage) ය
   (3) ජෝන් වොන් නියුමන් (John Von Neumann) ය
   (4) ඇඩා ඔගස්ටා ලෝව්ලස් (Ada Angesta Lovelace) ය
   (5) ජෝන් ප්‍රිස්පර් ඒකර්ට් (John Presper Eokert) ය

2. ආගණන උපක්‍රම වල (Computing devices) පරිණාමය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත සඳහන් කුමන වගන්තිය ද?
   (1) රික්ත නල භාවිතයෙන් බ්ලෙයිස් පාස්කල් විසින් පැස්කලීනය (Pascaline) නිපදවන ලදී.
   (2) පැස්කලීනය පළමු පරම්පරාවේ ආගණන උපක්‍රමයක් ලෙස සලකුණු ලැබේ.
   (3) රික්තක නල භාවිතා කර නිපදවන ලද පරිගණක දෙවන පරම්පරාවේ පරිගණක ලෙස සලකුණු ලැබේ.
   (4) Electronic Numerical Integrator And Cpomputer (ENIAC) පරිගණකය නිපදවීම සඳහා රික්තක නල භාවිතා කරන ලදී.
   (5) ඇපල් 1 හා ඇපල් 2 දෙවන පරම්පරාවට අයත් පරිගණක සඳහා උදාහරණ දෙකකි.

3. ක්‍රමලේඛන භාෂා සම්බන්ධයෙන් සත්‍ය වන්නේ පහත සඳහන් කුමන වගන්තිය ද?
   (1) යන්ත්‍ර භාෂා අයත් වන්නේ දෙවන පරම්පරාවේ ක්‍රම ලේඛන භාෂාවලටය.
   (2) ඇසෙම්බලි භාෂා ක්‍රමලේඛන ඕනෑම පරිගණකයක සෘජුවම ධාවනය කළ හැකිය.
   (3) ඇසෙම්බල් භාෂා අයත් වන්නේ පළමුවන පරම්පරාවේ ක්‍රමලේඛන භාෂාවලටය
   (4) ඇසෙම්බලි භාෂාව යනු මිනිසාට වඩා පහසුවෙන් කියවිය හැකි යන්ත්‍ර භාෂාවේ ම ආකාරයකි.
   (5) ඇසෙම්බ්ලර්ස් භාවිතයෙන් යන්ත්‍ර භාෂා ක්‍රමලේඛනවලට පරිවර්තනය කළ හැකි ය.

4. ක්‍රමලේඛන භාෂාවල විවරණ (comments) සම්බන්ධයෙන් පහත සඳහන් කුමන වගන්තිය සත්‍ය වේ ද?
   (1) ක්‍රියා කරවීම සිදුවන අවස්ථාවේ දී විවරණ විශේෂ යන්ත්‍ර උපදේශනවලට පරිවර්තනය වේ.
   (2) විවරණ සෑම විටම එක් පේළියකට සීමා කල යුතුය.
   (3) සියලුම ක්‍රමලේඛන භාෂාවල විවරණ ආරම්භ කළ යුත්තේ # සංකේතය සමගිනි.
   (4) ක්‍රමලේඛන තුළ විවරණ ඇතුලත් කිරීම එහි කාර්යය පැහැදිලි කිරීමට ගත හැකි හොඳ පුරුද්දකි.
   (5) පයිතන් ක්‍රමලේඛනයේ දී විවරණ සෑම විටම ආරම්භ කළ යුත්තේ පළමුවන තීරුවෙනි.

5. පයිතන් විචල්‍ය නාම සඳහා වලංගු නොවන්නේ පහත සඳහන් කවරක් ද?
   (1) MyCountry (2) mycountry
   (3) My country (4) My_country
   (5) _my_country_

6. ප්‍රතිසම (Analog) දුරකථන ජාලයක් හරහා සම්ප්‍රේෂණය කිරීම සඳහා සංඛ්‍යාංක (Digital) දත්ත, ප්‍රතිසම දත්තවලට පරිවර්තනය කරන්නේ පහත සඳහන් කුමකින් ද?
   (1) ජාල අතුරු මුහුණත (NIC) (2) මොඩමය (modem)
   (3) බහු පථ කාරකය (multiplexer) (4) බ්ලූටූත් අනුවර්තනය (adaptor)
   (5) Wi-Fi කාඩ්පත

7. මෙහෙයුම් පද්ධතියක ප්‍රධාන කාර්යයක් නොවන්නේ කුමක් ද?

(1) මතක කළමනාකරණය
(2) ක්‍රියායන නියමකරණය (Process Sheduling)
(3) ගොනු හැසිරවීම
(4) වයිරස අනාවරණය
(5) පරිශීලක අතුරු මුහුණත්කරණය

8. මෙහෙයුම් පද්ධතියක දී තවත් ක්‍රියාවලියක් ප්‍රධාන මතකයට ගෙන ඒම සඳහා ප්‍රධාන මතකයෙහි ඇති ක්‍රියාවලියක් ද්විතීයික ආචයනයට ගෙන යෑම ………………….. ලෙස හඳුන්වනු ලබයි

(1)) ඉල්ලුම් පිටු සැදීම (Demand paging)
(2) සන්දර්භ ස්විචයනය (Context Switching)
(3) ප්‍රතිහරණය (Swapping)
(4) අතුරු බිඳුම (Interrupting)
(5) නියමකරණය (Scheduling)

9. පහත සඳහන් කුමන වගන්තිය සත්‍ය වන්නේ ද?

(1) පරිගණක පාදක ඉගෙනුම් යනු ගුරු දිශාභිමුඛ ඉගෙනුම් ක්‍රමවේදයකි.
(2) ස්කයිප් (skype) යනු ප්‍රසිද්ධ විඩියෝ සම්මන්ත්‍රණ (Video conferencing) ක්‍රමවේදයකි
(3) අතථ්‍ය රූපී පුද්ගලික ජාල (VPN) ටෙලිකොමිනිය සඳහා මාධ්‍යයක් සපයයි.
(4) මාර්ග අපගත (offline) විභාග පැවැත්වීම පරිගණක සහකාරක ඇගයීම් (computer aided assements) සේ සැලකිය හැකිය.
(5) මයික්‍රොසොෆ්ට් පවර් පොයින්ට් යනු පරිගණක පාදක සමර්පණ සඳහා නිදහස් හා විවෘත ප්‍රභව මෘදුකාංගයකි. (FOSS)

10. $25_{10}$ ය තුල්‍ය ද්විමය සංඛ්‍යාවක් වනුයේ,

(1) 0100101
(2) 0100111
(3) 0011001
(4) 0010110
(5) 0010111

11. $5_{10}$ සහ - $9_{10}$ හි බිටු අටකින් සමන්විත (8 – bit) දෙකෙහි අනුපූරක ආකාර පිළිවෙලින්

(1) 00000101 සහ 11110111 ය
(2) 11111011 සහ 11110111 ය
(3) 00000101 සහ 10001001 ය
(4) 00000101 සහ 11110110 ය
(5) 11111011 සහ 11110110 ය

12. පහත දක්වා ඇති පයිතන් ක්‍රමලේඛනයේ ප්‍රතිදානය කුමක් ද?

```
S = " Nimal Perera"
print (S[1:3])
```

(1) Ni (2) im (3) ra (4) er (5) Pe

13. පහත සඳහන් පයිතන් වගන්තිය සලකන්න.

```
a = " 1 2 3"
b = 123
c = [ 'a' , 2 , (1,2,3)]
```

a,b හා c විචල්‍යවල දත්ත පුරූප පිළිවෙලින් කවරේ ද?

(1) ලැයිස්තුව (List) , නිඛිල (Interger) , තන්තුව (Srting)
(2) තන්තුව (Srting), නිඛිල (Interger) ,ලැයිස්තුව (List)
(3) නිඛිල (Interger), නිඛිල (Interger), ලැයිස්තුව (List)
(4) තන්තුව (Srting), තන්තුව (Srting), තන්තුව (Srting)
(5) තන්තුව (Srting), ඉපිලීම (Float), දත්ත පාදක සටහන (Tuple)

14. පහත දක්වා ඇති පයිතන් කේතය ක්‍රියාත්මක කළ විට ලැබෙන ප්‍රතිදානය කුමක් වේ ද?

```
x = 6
while x > 0 :
      x = x – 2
print (x , end = '   ')
```

(1) 6 (2) 42 (3) 246 (4) 420 (4) 0

15. 10 – 3 * 2 + 2.0 යන පයිතන් ප්‍රකාශනය ක්‍රියාත්මක කළ විට ලැබෙන අගය කුමක් ද?

(1) 16 (2) 16.0 (3) 6 (4) 6.0 (4) 28

16. පහත ගැලීම් සටහන සලකන්න.




ඉහත ගැලීම් සටහනේ ඇති දෝෂය කුමක් ද?

(1) එහි 'end' සංකේත දෙකක් තිබීම
(2) 'print' යනු වලංගු ඉගි පදයක් (Keyword) නොවීම
(3) එහි 'process' කොටුවක් නොමැති වීම
(4) එහි 'print' සංකේත දෙකක් තිබීම
(5) ගැලීම් දිශාවන් නිවැරදි නොවීම

17. $5D_{16} + 10111_2$

(1) $73_8$ (2) $75_{16}$ (3) $116_8$
(4) $163_8$ (4) $164_8$

18. $9.25_{10}$ හි ද්විමය නිරූපනය කුමක් ද?

(1) 1110011101
(2) 00001001.01
(3) 0000100101
(4) 1000100101
(5) 10001001.01

19. පහත කවරක් 'ටෙලිගමනය' (telecommuting) යන පදය පැහැදිලි කරයි ද?

(1) සේවකයෙකුට එකිනෙකට වෙනස් භූගෝලීයස ස්ථානවල සිට නවීන තාක්ෂණය භාවිතයෙන් රාජකාරිය පහසුවෙන් කිරීමට ඇති හැකියාව.
(2) විවිධ භූගෝලීය ස්ථානවල සිටින පුද්ගලයින් සමග මාර්ගගත (online) රැස්වීම් පැවැත්වීම්
(3) සමාජ සත්කාරය සඳහා ICT භාවිතා කිරීම
(4) තොරතුරු සමුද්ධරණය (retrieve) කිරීම සඳහා වෙබ් පාදක කරගත් යෙදුම් භාවිතය
(5) මූල්‍ය ගණුදෙනු මාර්ගගතව සිදු කිරීම

20. පහත සඳහන් කුමන ඉන්ද්‍රිය මිනිස් ශරීරයේ සංවෘත පද්ධතියක කොටසක් වේද?

(1) ඇස (2) කන (3) හෘදය (4) වකුගඩුව (5) පෙනහැල්ල

21. පහත දක්වා ඇති අවයනය (element) HTML ලේඛනයට ප්‍රතිබිම්බයක් අඩංගු කිරීම සඳහා වූ සලකුණකි. (makeup). ඔහි යොදා ඇති ප්‍රතිබිම්බයෙහි ප්‍රභව ගොනුවේ නම "arrow.jpg" වන අතර මෙය HTML ලේඛනය පවතින ෆෝල්ඩරයේ ම පවතී.

< img ………………. = "arrow.jpg" / >

ඉහත අවයවයේ ඇති හිස්තැන පිරවීම සඳහා වඩාත් ම යෝග්‍ය වන්නේ පහත සඳහන් දෑ අතුරෙන් කවරක් ද?

(1) alt (2) src (3) scr (4) href (5) link

22. පහත පෙන්වා ඇති ෆෝල්ඩර ව්‍යුහය සලකා බලන්න.




පහත සඳහන් දෑ අතුරෙන් කවරක් greeting.html ලේඛනයට සන්ධානගත (link) කිරීම සඳහා අන්තර්ගත කළ යුතු නිවැරදි සලකුන (markup) වන්නේ ද?

(1) < a href = "/greeting /birthday/greeting.html"> Greeting </a>
(2) < a href = "greeting /birthday/greeting.html"> Greeting </a>
(3) < a href = "shop/greeting /birthday/greeting.html"> Greeting </a>
(4) < a href = "/birthday/greeting.html"> Greeting </a>
(5) < a href = "greeting.html /birthday/greeting/shop/"> Greeting </a>

23. වෙබ් පිටුවලට අන්තර් ක්‍රියාකාරීත්වය (interactivity) ඇතුළත් කිරීම සඳහා බහුලව භාවිත කරන අනුග්‍රහ පාර්ශව සිද්ධිවල රාමු භාෂාව (client-side scripting langïge) වන්නේ පහත දක්වා ඇති දෑ අතුරෙන් කවරක් ද?

(1) CSS (2) PHP (3) XML (4) HTML (5) JavaScript

24. පහත දක්වා ඇති HTML අවයවය සලකා බලන්න.

<input type = text size = 10 />

ඉහත අවයවයේ 'size' නැමති උප ලක්ෂණය සඳහන් කරන්නේ,

(1) පික්සල්වලින් ඇති පාඨ කොටුවේ (text box) දිගටය.
(2) පාඨ කොටුවේ සංදර්ශනය වන උපරිම අනු ලක්ෂණ (characters) සංඛ්‍යාවටය
(3) පාඨ කොටුව තුල යතුරු ලියනය කළ හැකි උපරිම අනු ලක්ෂණ සංඛ්‍යාව
(4) පාඨ කොටුවේ අකුරු වර්ගයේ ප්‍රමාණයට ය.
(5) පාඨ කොටුව තුල සංදර්ශනය වන පේළි සංඛ්‍යාවටය.

25. විශේෂඥ පද්ධතියක් (Expert System) ලෙස සැලකිය හැක්කේ පහත සඳහන් කවරක් ද?

(1) බැංකු ටෙලර් යන්ත්‍රයක්
(2) පූර්ණ ස්වයංක්‍රීය රෙදි සෝදන යන්ත්‍රයක්
(3) මයික්‍රොවේව් උඳුනක්
(4) සුව සේවාවක රෝග විනිශ්චය කිරීමේ පද්ධතියක්
(5) ඉලෙක්ට්‍රොනික් රුධිර පීඩන මාපකයක්

26. ක්‍රමලේඛයක අභ්‍යන්තරික ක්‍රියාකාරීත්වය සලකා බැලෙන පරීක්ෂණ උපක්‍රමය (testing strategy) වන්නේ කවරක් ද?

(1) කාල මංජුසා පරීක්ෂණය (Black box testing)
(2) ශ්වෙත මංජුසා පරීක්ෂණය (White box testing)
(3) අනුකලන පරීක්ෂණය (Integration testing)
(4) පිළිගැනුම පරීක්ෂණය (Acceptance testing)
(5) ඒකක පරීක්ෂණය (Unit testing)

27. පහත සඳහන් තොරතුරු පද්ධති සංවර්ධන ආකෘතිවලින් ඉතාම කෙටි සහ රේඛීය සංවර්ධන ක්‍රියාවලියක් ඇත්තේ කුමකට ද?

(1) දිය ඇළි ආකෘතිය
(2) වස්තු නැඹුරු ආකෘතිය (object oriented)
(3) සර්පිලා ආකෘතිය
(4) වර්ධනාත්මක (incremental) සංවර්ධන ආකෘතිය
(5) ශීඝ්‍ර (Rapid)යෙදුම් සංවර්ධන ආකෘතිය

28. සම්බන්ධක දත්ත සමුදායක් (Relational Database) පිළිබඳව සත්‍ය වාක්‍ය පහත සඳහන් කවරක් ද?

(1) විකල්ප යතුරුවල (Alternate Keys) ඕනෑම උපකුලකයක් අපේක්ෂක යතුර (Candidate Key) ලෙස හැඳින්වේ.
(2) ප්‍රාථමික යතුරු (primary key) තෝරා ගනු ලබන්නේ විකල්ප යතුරු අතරින් ය.
(3) ආගන්තුක යතුරු (Foreign Key) යනු විකල්ප යතුරකි.
(4) සෑම විට ම සංයෝජන යතුරක් (Compoubd Key) සාදා ගැනීමට ප්‍රාථමික හා ආගන්තුක යතුරු සංයුක්ත කෙරේ.
(5) වගු දෙකක් අතර සම්බන්ධතාව ප්‍රාථමික හා ආගන්තුක යතුරු මගින් සිදු කරයි.

* ප්‍රශ්න අංක 29 සිට 31 දක්වා පිළිතුරු සැපයීමට සම්බන්ධතා දත්ත සමුදායක පවතින පහත පෙන්වා ඇති වගු තුන සලකා බලන්න. එක් විභායක දී එක් විෂයක් සඳහා එක් ප්‍රශ්න පත්‍රයක් පමණක් ඇති බව උපකල්පනය කරන්න.

subject

| subjectsID | title |
|---|---|
| SUB001 | Information and Technology |
| SUB002 | Chemistry |
| SUB003 | Physics |

exam

| examID | name |
|---|---|
| EXAM001 | GCE OL |
| EXAM002 | GCE AL |

exam subject

| examID | subjectID | examDate |
|---|---|---|
| EXAM001 | SUB001 | 2021.12.12 |
| EXAM002 | SUB001 | 2021.09.21 |
| EXAM002 | SUB002 | 2021.09.21 |
| EXAM002 | SUB003 | 2021.09.21 |

29. ඉහත දක්වා ඇති සම්බන්ධතා දත්ත සමුදායේ වගු නිරූපණය කිරීම සඳහා වඩාත් ම යෝග්‍ය භූතාර්ථ සම්බන්ධතා රූපය වන්නේ පහත රූපසටහන් වලින් කුමක්ද ?

(1)




(2)




(3)




(4)




(5)




30. පහත සඳහන් දෑ අතුරෙන් examSubject වගුව සඳහා නිවැරදි ප්‍රාථමික යතුර වන්නේ කුමක් ද?

(1) examId
(2) examId, subjectId
(3) examId, examDate
(4) subjectId, examDate
(5) examId, subjectId, name

31. අ.පො.ස. (උ.පෙළ) (GCE AL) භෞතික විද්‍යාව (physics) ප්‍රශ්න පත්‍රයේ පමණක් විභාග දිනය 2021.09.25 ලෙස වෙනස් කළ හැක්කේ පහත දැක්වෙන කුමන SQL වගන්තිය මගින්ද?

(1) update examSubject set examDate = ‘2021.9.25’ where subjectId = ‘SUB003’ or ‘sub003’
(2) update examSubject set examDate = ‘2021.9.25’ where examId = ‘EXAM002’and subjectID =‘sub003’
(3) update examSubject set examDate = ‘2021.9.25’ where examId = ‘EXAM002’and subjectID = ‘SUB003’
(4) update examSubject set examDate = ‘2021.9.25’ where examDate = ‘2021.9.21’
(5) update examSubject set examDate = ‘2021.9.25’ where examId = ‘EXAM002’ or subjectId =’SUB003’ or examDate = ‘2021.9.23’

32. OSI සප්ත ස්වර ස්ථර සමුද්දේශ ආකෘතිය තුළ දී IP නියමාවලිය අනුරූපණය වන්නේ ………….. ස්ථරයටය.
ඉහත හිස්තැන පිරවීමට වඩාත්ම යෝග්‍ය පිළිතුර වන්නේ,
(1) යෙදුම් (application)
(2) සැසි (session)
(3) ප්‍රවාහන (transport)
(4) ජාල (network)
(5) භෞතික (physical)

33. IP ජාලයක් තුළ DHCP සේවාදායකයේ (server) කාර්යය වනුයේ .......
(1) වසම් නාම IP ලිපිනවලට පරිවර්තනය කිරීමය
(2) වෙබ් පිටු නිහිත (cache) කිරීම ය.
(3) IP ලිපින ගතිකව පැවරීමය
(4) IP පැකැට්ටු පෙරීමය
(5) ආරක්ෂාව ලබා දීමය

34. පහත ප්‍රකාශ සලකන්න.

A – TCP යනු සම්බන්ධතා නැඹුරු (connection oriented) විශ්වාස සහගත නියමාලියකි. (protocol)
B – UDP යනු සම්බන්ධතා රහිත (connection less) විශ්වාසයෙන් තොර නියමාලියකි.
A – TCP සහ UDP යනු ප්‍රවාහන ස්ථාරයෙහි (transport layer) නියමාලිය වේ.

ඉහත ප්‍රකාශ අතුරින් කුමක් සත්‍ය වේද?
(1) A පමණි (2) B පමණි
(3) A හා B පමණි (4) B හා C පමණි
(5) A,B හා C සියල්ලම

35. පහත කවරක් C පන්තියේ ජාලයක ඇති සත්කාරක (host) පිටු ගණන සහ IP ලිපින ගණන පිළිවෙලින් දක්වයි ද?
(1) 8 සහ 256 (2) 8 සහ 65536
(3) 16 සහ 256 (4) 16 සහ 65536
(5) 24 සහ 256

36. පහත දැක්වෙන කුමන ජාල පන්තියකට 192.248.254.1 යන IP ලිපිනය අයත් වේද?

(1) A (2) B (3) C (4) D (5) E

37. NAND ද්වාරවලින් සමන්විත පහත දැක්වෙන තාර්කාක පරිපථය සලකන්න.



ඉහත පරිපථයෙහි අපේක්ෂිත ප්‍රතිදානය $AB + \bar{A}\,\bar{B} + \bar{C}$ වන්නේ නම් x හා y ආදාන කවරක් විය යුතු ද?

(1) x = B සහ y = c
(2) x = B සහ $y = \bar{c}$
(3) $x = \bar{B}$ සහ y = c
(4) $x = \bar{B}$ සහ $y = \bar{c}$
(5) $x = \bar{c}$ සහ y = B

38. පහත දී ඇති බූලීය ප්‍රකාශනය සුළු කළ විට ප්‍රතිඵලය කුමක් වේ ද?
$F(x,y) = \overline{xy}\,(\bar{x} + y)(y + \bar{y})$

(1) $\bar{x}$ (2) $\bar{y}$ (3) x (4) y (5) xy

39. පහත කවරක් කාර්යබද්ධ අවශ්‍යතා (functional requirement) දක්වයි ද?
A – පරිශීලකයන්ට තමන්ගේ ලිපිය හා දුරකථන අංක යාවත්කාලීන කිරීමට අවස්ථාව ලබා දිය යුතුය.
B – ඕනෑම පරිශීලක ඉල්ලීමකට ම 2ms ක කාලයක් තුල ප්‍රතිචාර දැක්විය යුතුය.
A – පද්ධතිය පහසුවෙන් වෙනස් කිරීමට හැකි විය යුතුය.

(1) A පමණි
(2) B පමණි
(3) C පමණි
(4) A හා C පමණි
(5) A,B හා C සියල්ලම

40. පහත ඒවා අතරින් CSS සම්බන්ධව සත්‍ය වන්නේ,
(1) විවිධ වර්ගයේ උපක්‍රමවලට භාවිත කළ හැකි වන සේ content වෙනස් කිරීමට style sheets ඉඩ ලබා දේ.
(2) offline cache එකක් මගින් වෙබ් යෙදුම් ගබඩා කිරීම CSS මගින් සිදු කළ හැක.
(3) offline වෙබ් අඩවි බැලීම (view) CSS භාවිතයෙන් සිදු කළ හැක.
(4) පිටු රාශියකට එකම style යෙදීම සඳහා external style sheet එකක් යෝග්‍ය වේ.
(5) ඉහත සියල්ල ම සත්‍ය වේ.

41. තොරතුරු සම්බන්ධ ස්වර්ණමය න්‍යාය මගින් හෙළි වන්නේ
(1) දත්ත විස්තරාත්මක වන විට එයට උපරිම අගය ලැබේ.
(2) තොරතුරු වල අගය කාලය ගතවත්ම පහළ යයි.
(3) තොරතුරු වල අගය කාලයත් සමඟ වෙනස් නොවේ.
(4) කල් ඉකුත් වූ තොරතුරු උපරිම වටිනාකමින් යුතුවේ.
(5) තොරතුරුවල වටිනාකම කාලය ගතවත්ම ඉහළ යයි.

42. පහත වගන්ති අතරින් සාවද්‍ය වන්නේ,
(1) අවසාන පරිශීලකයන්ට (final consumers) මාර්ගගතව භාණ්ඩ සහ සේවා විකිණීම B 2 Cනම් ඉලෙක්ට්‍රොනික වාණිජ්‍යය වේ.
(2) වෙබ් අඩවියක් ඔස්සේ ඉතා ශක්තිමත් සන්නම් නාම අනන්‍යතාවක් (brand identity) භාණ්ඩයක් විකිණීම සන්නම් නාමයක් නොමැති භාණ්ඩයක් විකිරීමට වඩා පහසු වේ.
(3) ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලිකත්වය සුරක්ෂිත කිරීමේ අපහසුතාවය මාර්ගගත අලෙවිකරුවන්ට මුහුණ දීමට ඇති ප්‍රධාන අභියෝගයකි
(4) සාම්ප්‍රදායික වානිජ්‍යයේ මෙන් ම ඊ අලෙවි සැල්වලට ද (E-markets) භෞතික වෙළඳ පොළවල් පවතී.
(5) යම් සමාගමක සැපයුම්කරුවන් සහ බෙදා හරින්නන් එකිනෙකට සම්බන්ධ කරන ජාල බාහිරජාල (extranets)

43. යම් කිසි brick – and – mortar ආයතනයක් තමන්ගේ ම මාර්ගගත අලෙවි මාර්ගයක් ආරම්භ කළ විට එය……………………… ආයතනයක් බවට පත්වේ.

(1) click - only
(2) Disintermediated
(3) bits- and-mortar
(4) click – and - mortar
(5) mortar only

44. තම පාරිභෝගිකයන් කෙළින් ම මිලදී ගැනීමක් (direct purchase) හෝ වෙනත් අලෙවිකරන ප්‍රතිඵලයක් වෙත යොමු කරවන වෙබ් අඩවියක් හඳුන්වනු ලබන්නේ,

(1) E-mail සහ Webcasting site
(2) Marketing website ලෙසය
(3) Promotion Website ලෙසය
(4) Online advertising website ලෙසය
(5) Web community site ලෙසය

45. පහත සියල්ල අතරින් එකක් පමණක් biometrics ගණයට නොගැනේ. එය කුමක් ද?

(1) ඇඟිලි සලකුණු
(2) මුර පද
(3) මුහුනේ ප්‍රකාශන (facial expressions)
(4) Retina
(5) හඬ

46. පරිශීලකයන් එක් ඉලෙන්ට්‍රොනික වානිජ්‍ය අඩවියක සිට තවත් ඉලෙක්ට්‍රොනික වානිජ්‍ය අඩවියක් වෙත යොමු කරවන විද්‍යුත් වානිජ්‍ය ක්‍රමය කුමක් ද?

(1) Spam
(2) Affiliate programs
(3) Phishing
(4) Viral marketing
(5) ඉහත කිසිවක් නොවේ

47. පිටුවක ප්‍රමාණය 1k වන සහ බිටු 15 හි තාර්කික මතක අවකාශයක් සලකන්න. එම පද්ධතියේ ඇති පිටු ගණන කොපමණද?

(1) 24
(2) 64
(3) 32
(4) 12
(5) 34

48. පහත ඒවා අතරින් CPU ජනනය කළ ලිපිනය වන්නේ,

(1) භෞතික ලිපිනය
(2) තාර්කික ලිපිනය
(3) නිරපේක්ෂ ලිපිනය
(4) අන්තර්ජාල ලිපිනය
(5) ඉහත කිසිවක් නොවේ.

49. කෘතීම බුද්ධියෙහි භාවිතා සඳහා උදාහරණ වන්නේ,

(1) Robotic surgery assistants සහ Vacuum cleners
(2) කාලගුණ අනාවැකි පැවසීමේ පද්ධති සහ නවීන ගෘහ අනතුරු සංඥා දැන්වීමේ පද්ධති (Modern home alarm systems)
(3) Modern home systems සහ කාලගුණ අනාවැකි පැවසීමේ පද්ධති (weather prediction systems)
(4) අන්තර්ජාල ලිපිනය
(5) ඉහත සියල්ලම

50. මෘදුකාංග නියෝජිත භාවිතාවක් සඳහා උදාහරණයන් නොවන්නේ කුමක් ද?

(1) නියමිත කාලයට වරක් අඛන්ඩව සිදුවන සෙවුම් යන්ත්‍ර සුචිගත කිරිම
(2) අන්තර්ජාල newsgroups නියාමනය
(3) සාහිත්‍ය පිළිතුරු පත්‍ර තක්සේරු කිරීම
(4) මිනිස් පරිශීලකයන් සමඟ බුද්ධිමය සංවාදයක නියැලීම (Simulating an intelligent conversation with human users)
(5) යම්කිසි දුරකථන ආකෘතියක් ඉලෙක්ට්‍රොනික නියෝජිතයන් මඟින් හොඳම මිල සොයා ගැනීම.